# 15 වසරකට පසු

ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව යථාර්ථයක් කළ හැකිද?

25 YEARS
1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

රටේ සිවිල් යුද්ධය අවසන් වී වසර 15 කට පසුව ද ශ්‍රී ලංකාව අඛණ්ඩව සැලකිය යුතු අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටී. අනුස්මරණ කිරීම, ඉඩම් ආශ්‍රිත ගැටුම්, මිලිටරිකරණය සහ ආර්ථික විෂමතාවය වැනි ගැටළු විසඳීමට අනුප්‍රාප්තික රජයන් උත්සහ කර ඇත. මෙම ගැටළුව සහ අනෙකුත් සමගාමී ගැටළු නොවිසඳී පැවතීම රටේ සහජීවනය සඳහා බලපෑම් කරයි. මෙම ප්‍රශ්න විසඳීමට සැබෑ කැපවීමකින් තොරව රජය කෙරෙහි විශ්වාසය අඩු මට්ටමක පවතින අතර, ඒ හේතුවෙන් සංහිඳියාව දුරස්ථව ඇති බව පෙනේ.

ගෝලීය වශයෙන් බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් වලට අදාළ සිදුවීම් 1980 දශකයේ සිට ඉහළම අනුපාතිකයක් සහිත ශ්‍රී ලංකාව සැලකිය යුතු අභියෝගයකට මුහුණ දී සිටී. පවුල් අන්ත අසරණභාවයට පත්කරමින් ශ්‍රී ලංකාවේ පුද්ගලයන් දහස් ගණනක් අතුරුදහන් වී ඇත. ජාත්‍යන්තර අවධානය සහ යුක්තිය සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කළ ද ඒවා නොතකා මෙම ගැටළුව දිගටම පවතින අතර ඒ හේතුවෙන් සංහිඳියා ප්‍රයත්නයන්ට බාධාවීම මෙන්ම බලපෑමට ලක් වූ ප්‍රජාවන් තුළ අඛණ්ඩ කම්පනය ඇති කිරීමට මෙම තත්වය හේතු වී තිබේ. අතුරුදහන්වීම් සම්බන්ධයෙන් වගවීමක් නොමැතිකම නිසා සමාජ බෙදීම් සහ රාජ්‍ය ආයතන කෙරෙහි විශ්වාසය පළුදු වී ඇති අතර එමගින් රාජ්‍ය පාලනයේ ක්‍රමානුකූල දෝෂ සහ අතීත අසාධාරණයන් විසඳීමට රාජ්‍යයේ අපොහොසත්කම පෙන්නුම් කෙරේ.

**එයා ලී ට්‍රැක්ටරයක් හදාගත්තා එයාට. එතකොට එයාට අවුරුදු 9යි. එයා මගේ කියතෙන් බුරුත ගහක් කපලා ඒක හැදුවා. එයා හරි දක්ෂයි. මේක ලස්සනට තිබුණා, දැන් මේක වේයෝ කාලා. මොනවා හරි දෙයක් එයාට කියන්න ඕනේ එක පාරයි. එකම දේ ආයේ ආයේ කියනවට එයා කැමති නැහැ. අනිත් අයට මේක නිකම්ම නිකම් ලී කෑල්ලක් විතරයි. ඒත් මට මේක එයා ගැන මතකයක්.**



පියා - සේගර් (වයස 66)
23 හැවිරිදි ආනන්ද සේගර් 2009 වසරේදී මාතලන් ප්‍රදේශයේදී අතුරුදන් වූයේ ය.



**එයා පැළ කරපු නෙල්ලි ගහක් තියෙනවා. එයා එක අත්තක් හිටෙව්වේ, දැන් ඒක ලොකු ගහක් වෙලා ගෙඩිත් තියෙනවා. එක දවසක් ඉස්කෝලෙ ඇරිලා එනකොට එයා අත්තක් අරන් ආවා. මම ඇහුවා ඒ මොකක්ද කියලා. එයා මගෙන් ඇහුවා අත්තක් පැළ කළොත් නෙල්ලි ගහක් හැදෙයිද කියලා. මම කිව්වා මම දන්නේ නැහැ කියලා. මම එයාට කිව්වා සාමාන්‍යයෙන් පොඩි පැළයක් තමයි පැළ කරන්නේ කියලා. එයා අත්ත පැළ කරලා වතුර දැම්මා. අපි පස්සේ අවතැන් වෙලා කඳවුරක හිටියේ. අපි ආපහු එනකොට එයා හිටවපු අත්ත ගහක් විදියට ලොකු වෙලා තිබුණා. අපිට දැන් එයාව මතක් වෙන්න තියෙන්නේ මේ නෙල්ලි ගහ විතරයි.**

මව - කාලිමුතු අලගම්මා (වයස 63)
කාලිමුතු නාගේන්ද්‍රන් (වයස අවුරුදු 17) 2009 පෙබරවාරි 17 වනදා පච්චෛපුල්මොට්ටෛ ප්‍රදේශයේදී අතුරුදහන් වූයේය.

**ජෝසප් පරරාජසිංහම් ඝාතනය, 2005**

පාර්ලිමේන්තු මංත්‍රී ජෝස්ප් පරරාජසිංහම්ගේ ඝාතන නඩුවේ විමර්ශන හා නඩු පැවරීම දීර්ඝ ප්‍රමාදයකට ලක්ව තිබිණි. විත්තිකරුවන්ට එරෙහි පාපොච්චාරණයන් සාකa▯ෂි ලෙස පිළිගත නොහැකි බවට අභියාචනාධිකරණය තීන්දු කිරීමෙන් පසු එවකට නීතිපතිවරයා විසින් අධිචෝදනා ඉවත් කිරීමට තීරණය කිරීම නිසා අවසානයේදී 2021 වසරේ විත්තිකරුවන් නිදහස් කරන ලදී.

**"The Trinco Five" : ත්‍රිකුණාමලයේදී දෙමළ සිසුන් පස් දෙනෙකු ඝාතනය කිරීම, 2006**

2006 ජනවාරි 2 වැනි දින දමිළ සිසුන් පස් දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් වූ නඩුව දීර්ඝ විමර්ශනයකින් සහ නඩු පැවරීමෙන් පසුව, සාක්ෂි නොමැතිකම හේතුවෙන් විත්තිකරුවන් 13 දෙනාම නිදොස් කොට නිදහස් කරන ලදී.

වැලිකඩ බන්ධනාගාර සිද්ධිය 2012

මෙම නඩුවේදී, කලින් හඳුනාගත් ඇතැම් සිරකරුවන් ඝාතනය කිරීමට  සංවිධානාත්මක මෙහෙයුමක් දියත් වූ බව අනාවරණය වූ අතර සිරකරුවන් 27දෙනෙකු ඝාතනය කළ අතර සිරකරුවන් හතලිස් දෙදෙනෙකු තුවාල ලැබීය. මෙම නඩුව ද වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට පුළුල් ලෙස බිය ගැන්වීම් සහ චූදිතයන් දේශපාලන පළිගැනීම්වලට ගොදුරු වූවන් ලෙස පෙන්වීමට උත්සාහ කර ඇත.

වැඩි විස්තර සඳහා කරුණාකර ඉහත QR කේතය පරීක්සන්න.

## සංකේතාත්මක නඩු විභාග

- කුමාරපුරම් සංහාරය
- ත්‍රිකුණාමලය පංච පුද්ගල ඝාතනය
- ජෝෂප් පරරාජසිංහම්
- නිමලරාජන් මයිල්වාගනම්
- පාසල් ළමුන් 11 දෙනෙකු පැහැරගැනීම
- ලසන්ත වික්‍රමතුංග
- නඩරාජා රවිරාජ්
- මිරුසවිල් හා බිඳුණුවැව සංහාර
- ප්‍රගීත් එක්නැළිගොඩ
- ACF සහනාධාර සේවක සංහාරය
- කීත් නොයාර්
- විශ්වමඩු

ශ්‍රී ලංකාවේ නීති රාමුව මර්දනකාරී නීති රැසකින් සමන්විත වී ඇති හෙයින් වඩා මර්දනීය ස්වභාවයක් ගෙන ඇති ආකාරය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ස්ථිර නීතියක් ලෙස දීර්ඝ කාලයක් පැවතීම මගින් නිරූපනය කෙරේ. මුලදී තාවකාලික විධිවිධානයක් ලෙස හඳුන්වාදුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉන්පසුව ආණ්ඩුවට විපක්ෂ පාර්ශවයන්ගේ හඬ යටපත් කිරීමත් රාජ්‍ය අනුමැතිය ලත් ප්‍රචන්ඩත්වය කල්පවත්වා ගැනීමත් අරමුණු කළ මෙවලමක් ලෙස භාවිත කරන ලදී. මෙම නීතිය භාවිත කර ඇති අත්තනෝමතික ආකාරය හේතුවෙන් යුක්තියේ හා මානව හිමිකම්වල මූලික මූලධර්ම යටපත් කර දණ්ඩ මුක්ති සම්ප්‍රදායක් නිර්මාණය වී ඇති අතර එමගින් අත්තනෝමතික ලෙස රඳවාතබා ගැනීම් හා වධහිංසා පැමිණවීම වැනි අගතිදායක ප්‍රතිඵල උදාකර තිබේ. මෙම ගැටළු විසඳීම අරමුණු කරගත් ව්‍යවස්ථායක උත්සහයන් ගැනීම වෙනුවට අදහස් ප්‍රකාශනයේ හා සමාගම් පැවැත්වීමේ නිදහස තවදුරටත් සීමා කරන නීති හඳුන්වාදීම මගින් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික රීතින් විනාශ වී ඇති අතර සමාජ ආතතීන් තව තවත් වර්ධනය කර තිබේ.

තවද, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත හා එවැනි නෛතික මුලපිරීම් ලංකාවේ පවතින අඛණ්ඩ අභියෝගය නැවත මතක් කර දෙයි. ඊට සමගාමීව, ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත රාජ්‍ය මර්දනය දිගටම පවත්වාගෙන යාමට හා නියමිත ක්‍රියාවලීන් තුළ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ හැකියාව පිළිබඳ විවේචනයට ලක්වී තිබේ. සමස්තයක් වශයෙන්, මර්දනකාරී නීති අඛන්ඩව පැවතීම මගින් විසම්මුතිය මර්දන කිරීම පමණක් නොව අවිශ්වාසය හා භීතිය පිරුණු වාතාවරණයක් නිර්මාණය කර ඇත. එමගින් තවදුරටත් සංහිඳියාව හා ජාතික සමගිය සඳහා වන ප්‍රයත්නයන්ට බාධා ඇතිවන අතර සැමදෙනා ඇතුළත්කරගන්නා සාධාරණ සමාජයක ඉදිරි ගමනට බාධාවක් ද වේ.

භාෂා අයිතිවාසිකම පිළිබඳ පරිමානය රාජ්‍ය පාලනය හා මානව හිමිකම් වැනි පුළුල් විෂය ක්ෂේත්‍රයක පැතිරුණු සංකීර්ණ ගැටළු මාලාවක් සමඟ සම්බන්ධ වේ. රාජ්‍ය හා පොදු අවකාශයන් තුළ සිංහල භාෂාවට ලබා දී ඇති ප්‍රමුඛත්වය හේතුවෙන් ඓතිහාසික වශයෙන් සුළු ජාතීන් කොන්කර කර ඇති අතර දෙමළ භාෂාව කතාකරන ප්‍රජාවන් කොන් කර ඇතැයි හැඟීම වර්ධනය කිරීමටත් ඔවුන්ගේ ඡන්ද අයිතිය අහිමි කිරීමටත් හේතු වී තිබේ. මෙම භාෂා විෂමතාවය සමාජ බෙදීම් පුළුල් කිරීම පමණක් නොව රට තුළ ගැඹුරු පද්ධතික අසමානතාවයක් පවතින බව සංකේත්වත් කරයි. භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වැනි මෙම විෂමතා ආමන්ත්‍රණය කිරීමට ගන්නා උත්සාහයන් බොහෝ විට ප්‍රමාණවත් නොවීම හෝ අකාර්යක්ෂම වීම, සුළුතර කණ්ඩායම්වල භාෂාමය අයිතිවාසිකම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අපොහොසත් වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, භාෂා අයිතීන් වටා ඇති නොවිසඳුනු ආතතීන් ශ්‍රී ලංකාවේ සැබෑ සංහිඳියාව සහ සමාජ සමගිය කරා ගමන් කිරීමේ ප්‍රගතියට බාධා කරමින් අසාධාරණය සහ වෙනස් කොට සැලකීම් පිළිබඳ පුළුල් කථිකාවකට දායක වී තිබේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිදුකරන ලද පර්යේෂණ මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ අනෙකුත් කොටස්වලට බෞද්ධ ඓතිහාසිකත්වය ප්‍රවර්ධනය කිරීමට පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට එල්ලවන චෝදනා ගෙනහැර දක්වනු ලැබ ඇත. චෝදනා එල්ල කර තිබේ. කුච්චවේලියේ සිට කුරුන්තුමාලෙයි දක්වා සුළු ජාතීන්ට අයත් සහ ඔවුන් භාවිත කරන ඉඩම් අත්පත් කර ගනිමින් ආගමික ඇතුළත් කිරීම් සහ සහජීවනය කඩාකප්පල් කරමින් පවතී. පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව සහ අනෙකුත් ක්‍රියාකාරීන් විසින් සිදුකරනු ලබන කාර්යයන් බොහෝ විට හින්දු ආගමික ස්ථාන ඉලක්ක කර ගනිමින්, ඒවා කලකට පෙර බෞද්ධ ස්ථානයන් බව ප්‍රකාශ කරමින්, ගැටුම් කරමින් සහ ජනතාවගේ ජීවනෝපායට තර්ජනයක් එල්ල කරයි. උදාහරණයක් ලෙස මුලතිව් තන්නිමුරිප්පු, කුරුන්තුමලේ ආගමික ස්ථානය සම්බන්ධයෙන් ගැටුම් ඇති වී තිබේ. තවත් උදාහරණයක් නම් වවුනියාවේ වෙඩුක්කුනාරිමලෙයි විහාරස්ථානය වසර කිහිපයක සිට ප්‍රචණ්ඩත්වයට හා නොසන්සුන්තාවට ලක්ව ඇත. ත්‍රිකුණාමලයේ පුල්මොඩේ ප්‍රදේශයේද මතුවන බෞද්ධ ස්ථාන සංඛ්‍යාව වැඩි වීමත් සමඟ මෙවැනිම ගැටළු මතුව ඇත. පහත දැක්වෙන පින්තූර මගින් කුරුන්තුමලෙයි, කුච්චවේලි සහ වෙඩුක්කුනාරි කන්දෙහි ප්‍රදේශ අත්පත් කරගෙන ඇති ආකාරය දැක්වේ.










සම්පූර්ණ ඡායාරූප එකතුව නැරඹීමට කරුණාකර ඉහත **QR** කේතය ස්කෑන් කරන්න.

# සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය

## සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ තෘප්තිමත්භාවය - ජාතික සහ ජනවාර්ගිකත්වය අනුව




## සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ තෘප්තිමත්භාවය - වර්ෂ අනුව




සමීක්ෂණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර **QR** කේතය පරීක්ෂා කරන්න.

ක්ෂේත්‍ර කටයුතු ප්‍රතිචාරකයින් 1350 ක් සමඟ 2024 ජනවාරි 4 වන දින සිට 22 වන දින දක්වා පවත්වන ලදී